# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 මැයි මස 07 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. ලිපි ලේඛන පිළිගැන්වීම
III. කාරක සභා වාර්තා පිළිගැන්වීම
IV. පෙත්සම්
V. ප්‍රශ්න

**01. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:** (ප්‍ර/V (01)13/07)

අ. කොළොන්නාව සමුපකාර සමිතියට සමුපකාර කොමසාරිස් විසින් පත්කර ඇති සභාපතිවරයාගේ අදූරදර්ශී ක්‍රියාපිළිවෙත හේතුවෙන් රන් සම්මානයෙන් පිදුම්ලද, සමිතිය පරිහානියට ලක්වෙමින් පවතින බව පිළිගන්නේද?

ආ. සභාපතිවරයා සමුපකාරය සතු වාහන ඇතුළු දේපළ අයථා ලෙස පරිහරණය කරන බව පිළිගන්නේද ?

ඇ. පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශ මූල්‍ය කඩාවැටීමකට ලක්ව ඇති බව පිළිගන්නේද?

ඈ. බැංකු තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම් සේවක වැටුප් ගෙවීම් අර්බුදයකට පත්ව ඇති බව පිළිගන්නේද?

ඉ. ග්‍රාමීය බැංකු අංශයෙන් සමිතිය වසර 02කට ලබාගෙන ඇති රුපියල් ලක්ෂ 300ක ණය මුදලේ පොලිය හා වාරික රු.5914201/- ගෙවා අයිරාව රුපියල් ලක්ෂ 500 දක්වා වැඩිකර වසර 10කින් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කරගෙන ඇති බව පිළිගන්නේද ?

ඊ. 2012.12.31 දිනට සමිතියේ ශුද්ධ පාඩුව රු.1,012,132/- බව පිළිගන්නේද ?

උ. ජාතික සමුපකාර මණ්ඩලයේ තැන්පත් කර තිබූ ග්‍රාමීය බැංකු තැන්පතුව රු.17,688,652/-ක මුදල කල්පිරීම හේතුවෙන් කොළොන්නාව මහජන බැංකුවේ ජංගම ගිණුමක තැන්පත් කළ බව පිළිගන්නේද?

ඌ. එම මුදල්ද වියදම් කර අවසන් බව පිළිගන්නේද?

එ. මෙම නිලධාරීන් සමිතියේ සියලු වත්කම් විනාශ කරන තෙක් සිටින්නේද?

ඒ. සමිතිය සඳහා නිලවරණයක් නොපවත්වන්නේ මන්ද?

**02. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/V (01)13/08)**

අ. කොළොන්නාව සමූපකාර සමිතියට නෙස්ලේ නියෝජිතත්වයක් හිමිව තිබූ බව පිළිගන්නේද?

ආ. සමිතිය සතුවූ නෙස්ලේ නියෝජිතත්වය අහිමි වී ඇති බව පිළිගන්නේද ?

ඇ. නෙස්ලේ බිල්පත් පියවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ග්‍රාමීය බැංකු අංශයෙන් රුපියල් ලක්ෂ 485ක් පාරිභෝගික අංශයට මාරුකර ඇති බව පිළිගන්නේද?

ඈ. සමිතිය සතු රුපියල් ලක්ෂ 80ක් පමණ වටිනා නෙස්ලේ නිෂ්පාදන නෙස්ලේ ආයතනයට භාරනොදී සමිතියේ ගබඩාකර ඇති බව පිළිගන්නේද?

ඉ. ගබඩාව තුළදීම එම භාණ්ඩ කල්ඉකුත්වී පරිභෝජනයට ගත නොහැකි භාණ්ඩ තත්වයට පත්වන බව පිළිගන්නේද ?

ඊ. මෙම භාණ්ඩ වෙනුවෙන් දිනකට රු.15,000/- ක දඩයක් නෙස්ලේ සමාගම වෙත ගෙවිය යුතු බව පිළිගන්නේද ?

උ. සමිතිය මෙම භාණ්ඩ භාරදී මෙම බැදීම් වලින් නිදහස් නොවන්නේ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. ශෝක ප්‍රකාශ යෝජනා

**01. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ආර්.එම්.ඩබ්ලිව් රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව**

“ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසරකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ආර්.එම්.ඩබ්ලිව් රත්නායක මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. ”

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

### 02. හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එස්.චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව

“ බස්නාහිර පළාතේ පළාත් සභාවේ තෙවන පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර පහක කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එස්.චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.

බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පල කර සිටියි. ”

(ඉදිරිපත් කිරීම - ගරු සභානායකතුමා විසින්)

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා :**

" බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති සියළුම කඩ සාප්පු සංකීර්ණ, රෝහල් ඇතුළු විවිධ ගොඩනැඟිලි හිමියන් විසින් එම ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීමේදී දෙනු ලබන පොදු පහසුකම් හා රථ ගාල් භාවිතා කරමින් පාරිභෝගිකයන්ගෙන් මුදල් අය කරනු ලැබේ. මෙම රථ ගාල් එම ගොඩනැඟිලි සඳහා අනුමැතිය දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා පළාත් පාලන ආයතනවල නීති රීති වලට අනුව නියම කරවන අතර, එම පහසුකම් විකිණීම නීති විරෝධී කටයුත්තකි.

එම නිසා, මෙම පොදු පහසුකම් පෞද්ගලික රථ ගාල් ලෙස ජනතාවගෙන් මුදල් ලබා ගැනීම අහෝසි කරවන ලෙසත්, ඉදිරියට එවැනි ආයතනවලට එරෙහිව නඩු පැවරීමට අදාල පළාත් පාලන ආයතන වලට බලය ලබා දෙන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි"

**(යෝ/v(01)12/19)**

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.04.23 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.